www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා මධ්‍යම ආසියාව තුල යුද්ධය උත්සන්න කරයි

## Obama escalates war in Central Asia

**2009 මාර්තු 30**

ජනාධිපති බරක් ඔබාමා විසින් ඇෆ්ඝනිස්ථානය සම්බන්ධයෙන් නිවේදනය කරන ලද නව මිලිටරි මූලෝපාය, ඇෆ්ඝනිස්ථානය තුල යුද්ධයේ ප්‍රධාන උත්සන්න වීමක් ද පකිස්තානය එක්සත් ජනපද මිලිටරි ක්‍රියාවන්ගේ රංග භූමියක් බවට නිල වසයෙන් පරිවර්තනය කිරීම ද සලකුනු කරයි.

ඇමරිකානු මහජනතාවට හොරෙන් සහ ජනාධිපතිවරනය තුල ප්‍රකාශයට පත් වූ යුද විරෝධී ජනමතය සම්බන්ධයෙන් පිලිකුලෙන් යුක්තව සූදානම් කරන ලද ඔබාමාගේ සැලසුම, ඉරාකය තුල බුෂ් ක්‍රියාවට දැමූ මිලිටරි බලය “වහාම ඉහල නැංවීම” ඇෆ්ඝනිස්ථානය තුල යලි අත්හදා බැලීමත් පකිස්තානය තුල තමන් රුචි පරිදි මිලිටරි ප්‍රහාර දියත් කිරීමත් ඉල්ලා සිටී. ඔබාමාගේ අපේක්ෂකත්වය සාමය දෙසට ගත් පියවරක් නොව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මූලෝපායික ප්‍රමුඛතා අරබයා ඇමරිකානු පාලක ප්‍රභූව තුල පැවති අරගලයක ප්‍රකාශනය බව එය තහවුරු කරයි. පෙන්ටගනය ඉරාකය මත උවමනාවට වඩා අවධානය යොමු කර තිබූ බවත් මිලිටරි ප්‍රචන්ඩත්වයේ ප්‍රධාන ඉලක්කය විය යුත්තේ මධ්‍යම ආසියාව බවත් විශ්වාස කල පුද්ගලයන් වෙනුවෙන් ක්‍රියා කල පෙරමුනේ රාල ලෙස ඔබාමා සේවය කලේය.

ප්‍රදේශයේ එක්සත් ජනපද පාලනයට බාධා කරන පකිස්තාන හා ඇෆ්ඝනිස්ථාන ජනගහනයේ කොටස් තුරන් කර දැමීම එල්ල කරගත්, ලේවැකි සන්සිඳුවීමේ ව්‍යාපාරයක් පකිස්තානය හා ඇෆ්ඝනිස්ථානය තුල ගෙනයාමට ඔබාමා සූදානම් වේ. ඇමරිකානු ජනතාවට ද දැවැන්ත මිලක් ගෙවීමට සිදු වනු ඇත. ඒ, දහස් ගනනින් මිලිටරි ජීවිත හානිය ද ඩොලර් බිලියන සිය ගනනින් පුච්චා දැමීම ද එය ඉස්ලාම් ලෝකයට එරෙහිව යුද්ධයක් ගෙන යන බවට පුලුල්ව දැරෙන සංජානනය තව දුරටත් ශක්තිමත් කිරීමට වොෂිංටනය ක්‍රියා කරන තතු තුල ඇමරිකානුවන්ට එල්ල වන ත්‍රස්ත ප්‍රහාරවල අවදානම ඉහලයාමක් ද ලෙස ය.

එක්සත් ජනපදයේ නාමික හිතවතකු වන පකිස්තානය විජිතයක තත්වයට ලඝු කෙරෙන බවට තර්නය කෙරෙයි. මිලියන 173ක ජනගහනයකින් යුක්ත හා න්‍යෂ්ටිකව සන්නද්ධ මිලිටරියක් සහිත රටක් වන පකිස්තානය, අතිශයින් දුප්පත් සහ ප්‍රාදේශීය හා ජනවාර්ගික භේදයන්ගෙන් ඉරිතලා ගිය රටකි. ඇෆ්ඝනිස්ථානයට යාබද ගෝත්‍රික ප්‍රදේශවල වාසය කරන පකිස්තානුවන් සිය ගනනක් දැනටමත් මරා දමා ඇති එක්සත් ජනපද ප්‍රහාර උත්සන්න වීමක්, පකිස්තාන මහජන මතය තව දුරටත් ප්‍රකෝප කොට, පකිස්තාන මිලිටරියේ කොටස් විරසක කරවා, කලාපය තුල මිනිය නොහැකි තරමේ ප්‍රතිවිපාක සහිතව, රට සිවිල් යුද්ධය දෙසට තල්ලු කරනු ඇත.

එය “ඇෆ්ඝනිස්ථානය තුල නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ බුෂ් මහතාගේ අපැහැදිලි කතා” අතහැර දමන බැවින්, ඔබාමාගේ සැලසුම යුද්ධය “පටු කිරීමක්” ලෙසට *නිව් යෝර්ක් ටයිම්ස්* කරන විස්තර කිරීම ප්‍රතිරාවය කරන අය, මහජනතාව මුලා කිරීමට උත්සාහ දරනවා පමනි.

මෙම කියාපෑම් එක්සත් ජනපද මිලිටරි ක්‍රියාවන්ගේ පුලුල් වන පරාසය මගින් මුසා බවට පත් කෙරෙනවා පමනක් නොව, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ වඩා කෙලින් කතා කරන නියෝජිතයන්ගේ ප්‍රකාශ මගින් ඒවා සෘජුවම අභියෝගයට ලක් කෙරී ඇත. ඊයේ *ෆොක්ස් නෙට්වර්ක්* රූපවාහිනියේ පැවති සම්මුඛ සාකච්ඡාවක දී බුෂ්ගේ “ත්‍රස්ත විරෝධී යුද්ධය” සහ ඔබාමාගේ “අන්තවාදයට එරෙහි යුද ව්‍යාපාරය” අතර වෙනස පිලිබඳව විමසන ලදුව, ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස් මෙසේ පිලිතුරු දුන්නේය: “මං හිතන්නෙ ඒ වෙනස්කම් කිසිවක් නැති තැන්වල වෙනස්කම් සොයන මිනිස්සු කියලා.” ඔබාමා මේ වන තෙක් නිවේදනය කර ඇති 59,000 හට පිරිසක් වෙනුවට එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානයට 68,000ක හමුදාවක් යවනු ඇතැයි ද ගේට්ස් තව දුරටත් සඳහන් කලේය.

යුරෝපා ආන්ඩුවල පක්ෂපාතී ප්‍රකාශ තිබිය දී ම, ඔබාමාගේ යුද උත්සන්නිය වොෂිංටනයේ ඒකපාර්ශ්වික තීන්දුවකි. බ්‍රිතාන්‍යය තවත් 1,700ක හට පිරිසකින් දායක වීමට යෝජනා කර ඇති අතර සෙසු රටවල් ගනනාවක් ම ඇෆ්ඝන් පොලීසිය සඳහා පුහුනුකරුවන් යැවීමට ඉඩ ඇත. කෙසේවෙතත්, සිය නැටෝ සගයන් සැලකිය යුතු ප්‍රමානයකින් හට කන්ඩායම් දායක කිරීමක් එක්සත් ජනපද නිලධාරින් බලාපොරොත්තු නොවන අතර ඔවුහු දකුනු ඇෆ්ඝනිස්ථානයේ මෙහෙයුම් සඳහා වෙනම ඇමරිකානු මිලිටරි අන දෙන මධ්‍යස්ථානයක් පිහිටුවීමට යති.

යුද උත්සන්නිය සඳහා ඔබාමා දී ඇති හේතු අර්ධ සත්‍යයන් හා අසත්‍යයන් ය. අන් සියල්ලටමත් වඩා එය ත්‍රස්තවාදයේ තර්ජනයට ප්‍රතිචාරයක් ය යන කියාපෑම අසත්‍යයකි. මෙම යුද්ධය වනාහි, තෙල්වලින් පොහොසත් මධ්‍යම ආසියාවේ ආධිපත්‍යය සඳහා වන අරගලය අඛන්ඩව ඉදිරියට ගෙනයාමකි. මධ්‍යම ආසියාවේ පරඳුවට තබා ඇති දේවල් -- නල මාර්ග, ජාත්‍යන්තර වෙලඳමෙහි පාලනය, මිලිටරි වාසි -- පසුගිය 25 වසරක එක්සත් ජනපද යුද්ධ සියල්ලට ගාමකය වී තිබේ. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට මෙම කලාපයේ ඇති මූලෝපායික වැදගත්කම -- චීනය, රුසියාව, ඉන්දියානු උප-මහාද්වීපය සහ මැද පෙරදිග අතර මාර්ගවල සන්ධිස්ථානයක්ව පැවතීම -- තහවුරු කරමින්, චින්තන පර්ශද සහ එක්සත් ජනපද විදේශ පිලිවෙත් විශේෂඥයන් විසින් කරන ලද නිමක් නැති විශ්ලේෂන කෙනෙකුට පහසුවෙන්ම උපුටා දැක්විය හැකිය.

මෙම කලාපය දිගු කලක් තිස්සේ ඇමරිකානු පාලක පන්තිය ප්‍රමුඛව යෙදීගත් කේන්ද්‍රීය ප්‍රදේශයක් වී තිබේ. මෙම වර්ෂය, වොෂිංටනය ඇෆ්ඝනිස්ථානයේ කල පලමු ප්‍රධාන මැදිහත්වීමෙහි, එනම්, සෝවියට් ආක්‍රමනයක් අවුලුවාගැනීමේ එල්ලය ඇතිව කාබුල්හි සෝවියට් පිටුබලය ලද තන්ත්‍රය අස්ථාවර කිරීමට එය 1979 දී ගත් තීන්දුවෙහි, 30 වන සංවත්සරය සලකුනු කලේය. ක්‍රෙම්ලිනය ආක්‍රමනය සිදු කලාට පසුව, වොෂිංටනය සෝවියට් විරෝධී මුජහිදීන් ව්‍යාපාරයේ අන දෙන නිලධාරින්ට හා ග්‍රාමීය වංශාධිපතියන්ට මුදල් ආධාර සහ අවි ආයුධ සැපයීය. මත්ද්‍රව්‍ය ජාවාරම්කාර යුද ප්‍රධානීන්ගෙන් සමන්විත වත්මන් ඇෆ්ඝන් පාලක ප්‍රභූව පැනනැංගේ ඔවුන්ගෙනි.

"ෆොක්ස් නිව්ස් සන්ඩේ" වැඩසටහනෙහි සිය සම්මුඛ සාකච්ඡාවේ දී, ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද විරෝධී කැරලිකාර හමුදා සමග පකිස්තාන මිලිටරි බුද්ධි අංශවලට ඇති සබඳතා පිලිබඳ ප්‍රශ්නයකට ගේට්ස් ප්‍රතිචාර දැක්වූයේ, "එම කන්ඩායම්වලින් සමහරෙකුට පකිස්තානයේ අපගේ ආරක්ෂිත මධ්‍යස්ථානවලින් අවි ලැබීම සහතික කරගනු වස් උදව් කිරීමෙහිලා" 1980 ගනන්වල දී තමන්ම පුද්ගලිකව යෙදීගත් අයුරු සටහන් කරමිනි.

සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය බිඳවැටීමෙන් පසුව, එක්සත් ජනපදය කලාපය තුල සිය යටිකූට්ටු වැඩ දිගටම ගෙන ගියේ, ආරම්භයේ දී 1990 ගනන්වල තලිබාන් ව්‍යාපාරයට පිටුබලය සැපයීමෙන් සහ අනතුරුව සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් පසුව ඔවුන් බලයෙන් පහ කරනු පිනිස ඇෆ්ඝනිස්ථානය ආක්‍රමනය කිරීමෙනි.

වොෂිංටනය විසින් මීට පෙර දියත් කරන ලද යුද්ධවල දී මෙන්ම, මෙහි දී ද ඔබාමාගේ මැදිහත්වීම, තවත් හා වඩාත් භයංකර ගැටුම් පවා නිර්මානය කරනු ඇති, වර්ධනයන් අවුලුවාලීමට පමනක් තුඩු දෙයි. ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද යුද උත්සන්නිය දෙස රුසියාව බියෙන් හා සැකෙන් බලනු ඇත. පකිස්තානයේ යුද කලාප මග හරිමින් ඇෆ්ඝනිස්ථානයට එක්සත් ජනපද සැපයුම් මාර්ග ගොඩනැගීම මගින් අදහස් කෙරෙනු ඇත්තේ, රුසියාවට බලගතු මූලෝපායික අවශ්‍යතා පවත්නා ප්‍රදේශ -- කොකේසස්, කලින් සෝවියට් සංගමයේ කොටස් ලෙස පැවති මධ්‍යම ආසියාව, සහ බොහෝ විට ඉරානය -- තුල එක්සත් ජනපද ආනුභාවය වර්ධනය වීමයි. මෙය සිදු වන්නේ, ජෝර්ජියාවේ සිය රූකඩ තන්ත්‍රය දකුනු ඔසෙටියාවේ රුසියානු සාමසාධක හමුදාවලට එල්ල කල ප්‍රහාරයකට සහයෝගය දීම මගින් වොෂිංටනය යුද්ධයක් අවුලුවාගැනීමේ ආසන්නයට යාමෙන් යන්තම් මාස කිහිපයකට පසුවය.

මුස්ලිම් පකිස්තානය සහ හින්දු බහුතරයක් සහිත ඉන්දියාව අතර දිගු කලක් තිස්සේ පවතින සතුරුකම තිබුනා වුවත්, පකිස්තානය වියවුලට හා සිවිල් යුද්ධයට ඇද වැටීම ඉන්දියාවට බරපතල තර්ජන එල්ල කරනු ඇත. එක්සත් ජනපද මිසයිල ප්‍රහාර කාශ්මීරයේ ඉන්දු-පකිස්තාන දේශසීමා ගැටුම තව දුරටත් ඔද්දල් කරනු ඇති අතර, ඉන්දියානු කාශ්මීරයේ ගරිල්ලා ව්‍යාපාරයට ආධාර කරනු වස් පකිස්තාන රාජ්‍යය බලමුලුගන්වන දක්ෂිනාංශික මුස්ලිම් ජනමතය අවුලුවාලනු ද ඇත. මෙය, ඉන්දියාවේ මුස්ලිම් සුලුතරයේ අනාරක්ෂිත තත්වයට තර්ජනය කරනවාට අමතරව, සිවු වන ඉන්දු-පකිස්තාන යුද්ධයක අවදානම ද ගෙන එයි. එය මෙවර න්‍යෂ්ටිකව සන්නද්ධ රාජ්‍යයන් දෙකක් අතර සිදු වන යුද්ධයක් වනු ඇත.

එක්සත් ජනපදයේ හිගයන් පියවාගැනීමට මුදල් සැපයීම ද ඩොලරයට මුක්කු ගැසීම ද දිගටම කරගෙන යාමට චීනය දක්වන පැකිලීම අරබයා එක්සත් ජනපදය හා චීනය අතර ආතතීන් වැඩෙන තතු තුල, ඉන්දියානු උප-මහාද්වීපය තුල චීනයේ ප්‍රධාන මිතුරා වන පකිස්තානයේ කෙරෙන ඇමරිකානු මැදිහත්වීමක්, චීනය සමග ඇමරිකානු ගැටුමක් ඇවිලීමේ අවදානම ඉහල දමනු ඇත.

ඔබාමාගේ සැලසුම, එක්සත් ජනපද මිලිටරිවාදය සහ ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ බාදනීය තත්වය අතර පවත්නා සම්බන්ධතාව එලිදරව් කරයි. යුද්ධයට පවත්නා අතිමහත් මහජන විරුද්ධත්වය පුරුද්දක් වසයෙන් නොතකා හැර හා උල්ලංඝනය කර තිබේ. ඔබාමාගේ සැලසුම සම්මත කෙරුනේ කොංග්‍රස් මන්ඩලයේ අනුමැතියකින් හෝ මහජන විවාදයකින් තොරවය.

එය ප්‍රකාශයට පත් කෙරුනු අවස්ථාව තෝරා ගැනුනේ මහජන අවධානය හා පරීක්ෂාව වලකනු පිනිසය. ඊට යන්තම් දින දෙකකට පෙර ඔබාමා සැන්දෑවේ

බහුතරයක් රූපවාහිනිය නරඹන වේලාවක ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වූ අතර එහි දී ඇෆ්ඝනිස්ථානය පිලිබඳ කාරනාව මතු කෙරුනේ නැත. යුද්ධය ප්‍රධාන වසයෙන් උත්සන්න කිරීමක් නිවේදනය කරනු වස් ඔහු තෝරාගත්තේ පෙ.ව. 9.30ට පැවැත්වූ ප්‍රශ්න ඇසීමට අවසර නැති ප්‍රවෘත්ති සාකච්ඡාවකි. ඒ අවස්ථාවේ මහජනතාවගෙන් වැඩි කොටසක් රැකියාවන්හි නිරතව සිටි බැවින් එය නැරඹීමේ හැකියාවක් නොතිබුනි. ඔබාමා කතා කරන අවස්ථාවේ, ඔහු දෙපසින් ගේට්ස් සහ දිගටම තනතුරුවල රැඳී සිටින බුෂ් පාලනාධිකාරයේ සෙසු නිලධාරින් සිටි අතර, මිලිටරියේ ඉහල නිලධාරින්, චින්තන පර්ශදකරුවන් හා සෙසු වෘත්තීය යුද අපරාධකරුවන් එහි සිටී යන කරුන ඔහු සඳහන් කලේය.

ජනාධිපති කාර්ය මන්ඩලය මෙලෙස මිලිටරීකරනය වීම එක්සත් ජනපද සමාජ ජීවිතය තුල පවත්නා දූෂ්ට සම්පන්න ප්‍රවනතා ප්‍රකාශයට පත්කරයි. මීට දස වසරකට ඉහත දී සර්බියාවට එරෙහි එක්සත් ජනපද බෝම්බ ප්‍රහාර පිලිබඳව අදහස් දක්වමින්, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මෙසේ ලිවීය: "ඇමරිකානු සමාජය තුල පවත්නා පුලුල් වන සමාජ පරතරය, කේන්ද්‍රීය ප්‍රජාතන්ත්‍ර වටිනාකම් තුල මුල්බැසගත් පුලුල් පදනමකින් යුක්ත සමාජ ඒකමතික භාවයක මවාපෙන්වීම පවා පවත්වා ගෙන යා නොහැකි අවස්ථාවට, මේ වන විට ලගා වී නැති නම්, එම අවස්ථාව කරා වේගයෙන් ලගා වෙමින් පවතී. . . . ධනය නිර්මානය කරන ක්‍රියාදාමයේ සුවිශේෂ ස්වභාවය, එනම්, ඉහල යන කොටස් අගයන් මගින් ධනවත්වීම, ගැඹුරින්ම කම්කරු පන්තික විරෝධී හා අධිරාජ්‍ය-ගැති ස්වභාවයක් දරන සමාජ හා දේශපාලනික ආකල්ප බෙහෙවින් ස්වභාවිකව නිර්මානය කරයි."

ඉන් අනතුරුව බුෂ් යටතේ එක්සත් ජනපද මිලිටරිවාදය පිපිරීම ද පසුගිය වසරේ දී මූලික ආර්ථික අර්බුදයක පිපිරී ඒම ද මගින් සිදු වූයේ මෙම විශ්ලේෂනය සනාථ වීමකි. ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑම් ද දැන් ඔබාමාගේ යුද්ධය උත්සන්න කිරීමේ පිලිවෙත ද සමග, යුද්ධය එක්සත් ජනපද විදේශ පිලිවෙතෙහි අත්‍යවශ්‍ය ආම්පන්නයක් මෙන් ම රට තුල පන්ති ගැටුම් මැඩීමේ හා ඇමරිකානු සංගතවල ලාභදායි බව සහතික කිරීමේ ද විධි ක්‍රමයක් බවට පත්ව තිබේ. බලගතු තෙල් හා ගෑස් සංගත වෙනුවෙන් සූත්‍රගත කෙරුනු ඔබාමාගේ මධ්‍යම ආසියානු පිලිවෙත, වෝල් වීදියට හා සුපිරි ධනවතුන්ට ඩොලර් ට්‍රිලියන ගනනින් දොල පිදේනි දීම වටා කේන්ද්‍රගත කෙරුනු දේශීය පිලිවෙතක බාහිර මුහුනතයි.

"වෙනසක්" සඳහා වූ ඔහුගේ මැතිවරන ව්‍යාපාරය, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා ප්‍රචන්ඩ ලෙස තහවුරු කරගැනීම තුල ඇති කර ගැනෙන උපායාත්මක මාරුවක් සඳහා වේදිකාව සැකසීමේ එල්ලයෙන් යුක්ත, දේශපාලන වංචාවක් විය. යුද්ධයට හා සමාජ ප්‍රතිගාමීත්වයට විරුද්ධ විය හැකි වන්නේ, ඩිමොක්‍රැටික් පක්ෂයට ආයාචනා කිරීම මගින් නොව, ධනවාදයට එරෙහි අරගලය තුල කම්කරු පන්තිය බලමුලුගැන්වීම හරහා ම පමනි.

***ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩලය***